# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்திறன் அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2018

**නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය**

**நகர திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சு**

**MINISTRY OF CITY PLANNING AND WATER SUPPLY**

අංක 35 , "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල
இல 35,"லக்தியமெதுர",புதிய பாராளுமன்ற வீதி, பெலவத்த, பத்தரமுல்ல
**No. 35, "Lakdiya Medura", New Parliament Road, Pelawatta, Battaramulla**

# වාර්ෂික

# කාර්ය සාධන වාර්තාව

# 2018

## නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

අංක 35 , "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

දුරකතන අංක - 0112177240, 0112177241

ෆැක්ස් - 0112177242

විද්‍යුත් තැපැල - **secretary@mcpws.gov.lk**

වෙබ් අඩවිය – **[www.mcpws.gov.lk](http://www.mcpws.gov.lk)**

## දැක්ම

වඩා යහපත් ජීවිතයක් සඳහා සැලසුම්ගත නගර, සුරක්ෂිත පානීය ජලය සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක පහසුකම් සැලසීම

## මෙහෙවර

ජෛවී පරිසරය සහ ජල සම්පතෙහි ආරක්ෂාව තහවුරු කරමින් ස්ථිරසාර නගර සැලසුම්කරණය, සුරක්ෂිත පානීය ජල සැපයුම සහ ප්‍රමාණවත් වැඩිදියුණු කළ සනීපාරක්ෂක පහසුකම් සැපයීම මඟින් ජන ජීවිතයේ ගුණාත්මක තත්ත්වයන් තහවුරු කරලීම සඳහා ජනතාවට පහසුකම් සැලසීම

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



මිනිසා ඇතුළු ජීවයේ උපත, විකාශය හා පැවැත්ම තීරණය කෙරෙන ප්‍රධාන සාධකය වන්නේ ජලයයි. එබැවින් වර්තමානයේ අන්තර්ජාතික ප්‍රජාව හා ආයතන විසින් ජලය මිනිසාගේ මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන සැමට ජලය සඳහා සම ප්‍රවේශ අවස්ථා ඇති කිරීමටත් ලෝකයේ තිරසරභාවය සඳහා ජලය සංරක්ෂණය කිරීමටත් විශේෂ අවධානයක් යොමු කර ඇත.

ශ්‍රී ලංකාව ද ලෝක ප්‍රජාවගේ ඉහත අභිප්‍රාය අනුව යමින් සැමට ආරක්ෂිත පිරිසිදු පානීය ජලය සැපයීමට හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ඇති කරලීමට විශේෂ ප්‍රයත්නයක් දරනු ලබයි. රජය විසින් මෙම සුවිශේෂී වගකීම පවරා ඇත්තේ මාගේ අමාත්‍යාංශයටයි.

අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මෙහෙයවමින් මෙම වගකීම ඉටු කරලීමට පසුගිය සිව් වසරක කාලයේ දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵල ලෙස 2015 වසරේ දී 86%ක් වූ ආරක්ෂිත පානීය ජල සැපයුම 90.60% දක්වා ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත. තවද 2015 වසරේ දී 45.9%ක් වූ ආරක්ෂිත නල ජල සැපයුම් ආවරණය 2018 අවසන් වන විට 50.5% දක්වා ඉහළ නංවන ලදී.

පානීය ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් ඉහළ නැංවීමට විශේෂ කාර්යභාරයක් ඉටු කළ වසරක් ලෙස 2018 වසර සඳහන් කළ හැකිය. මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන සඳහා 2018 ජාතික අයවැය ලේඛනයෙන් රුපියල් බිලියන 35ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ම වැය කරමින් වසර තුළ දී මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති 04ක් නිම කිරීමටත් නව ව්‍යාපෘති 08ක් ආරම්භ කිරීමටත් හැකි විය. මීට අමතරව දේශීය බැංකු ණය අරමුදල් යටතේ රු.මි. 5,000කට ආසන්න මුදලක් වැය කරමින් මහා පරිමාණ ජල යෝජනා ක්‍රම 15ක් ක්‍රියාත්මක කරන ලදී.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති වගකීම් අතරින් ප්‍රධාන තැනක් හඳුනා නොගත් වකුගඩු රෝගය ව්‍යාප්තව පවතින දිස්ත්‍රික්ක 11ක ජනතාවට පානීය ජල පහසුකම් සැපයීමට හිමි වේ. එම ප්‍රදේශවල ජනතාවට සුරක්ෂිත පානීය ජලය කෙටිකාලීනව සැපයීමට ජල දිගුවන් ඇති කිරීම හා ප්‍රති ආශ්‍රැත යන්ත්‍ර මඟින් ජලය සැපයීමට රු.මි. 500ක් පමණ වැය කළ අතර තවද දිගුකාලීනව එම ප්‍රදේශවලට ජලය සැපයීමේ යෝජනා ක්‍රම ඇති කිරීමට පියවර ගන්නා ලදී. චීන රජයේ අනුග්‍රහයෙන් පේරාදෙණියේ ස්ථාපිත කරනු ලබන චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතියේ කටයුතු 2018 වසර තුළ ආරම්භ කිරීමට ලැබීම වසර තුළ ලැබූ විශේෂ ජයග්‍රහනයකි. මෙම සියල්ලේ ප්‍රතිඵල ලෙස වර්තමානයේ වාර්තා වන වකුගඩු රෝගීන්ගේ ප්‍රමාණය අඩු වීම මහත් සතුටට කරුණකි.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති අනෙක් වැදගත් කාර්යය වන අඩු දියුණු ප්‍රදේශවල පිහිටි නාගරික කේන්ද්‍රයන්හි යටිතල පහසුකම් සංවර්ධනයයි. මේ සඳහා රු.මි. 3,500කට ආසන්න මුදලක් වෙන් කර තිබූ අතර එම මුදල යොදා ගනිමින් ව්‍යාපෘති 427ක් ක්‍රියාවට නංවන ලදී.

මෙම සියලු ව්‍යාපෘතීන් හා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී මා වෙත සහයෝගය දැක් වූ ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති, සාමාන්‍යාධිකාරී ඇතුළු සියලුදෙනාටත් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ඇතුළු සැමටත් ස්තුති කරමින් මාගේ පණිවිඩය අවසන් කරමි.

**රවුෆ් හකීම් (පා.ම)**

නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය

# ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ජල සම්පාදනය සඳහා විශාල පරිශ්‍රමයක් සහ පිරිවැයක් දරා පානීය ජලය මහජනතාව අතර බෙදාහරිනු ලැබුව ද එය ඉතා සාධාරණ මුදලකට මහජනතාව වෙත ලබාදීමේ ගැටලුවට අද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත් මුහුණ දෙන බරපතල අභියෝගයකි. එබැවින් මෙම බරපතල අභියෝගය ජයග්‍රහණය කිරීමට අප අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්ය සාධනය කාර්යක්ෂමතාවය ඉතා වැදගත් වන අතර මෙම ගැටළු නිරාකරණය කර ගැනීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහය ද අත්‍යාවශ්‍ය වේ.

අප ජීවත් වන පෘථිවිය ජලයෙන් පිරුණ ග්‍රහලෝකයක් වුවද ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඉතා සීමිතය. එමෙන්ම ලෝකයේ සීඝ්‍රයෙන් වැඩි වන ජන සංඛ්‍යාව හා ඔවුන්ගේ අවශ්‍යතා මත ජල පරිභෝජනය ද ඉහළ ගොස් ඇත.

එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුවට අනුව වසර 2050 වන විට ලෝකයේ රටවල් 60කට වැඩි සංඛ්‍යාවක් උග්‍ර ජල හිඟයකට මුහුණපානු ඇත. ශ්‍රී ලංකාව තුළ මෑත කාලීනව ඇතිවුණු ස්වභාවික ව්‍යසනයන් දෙස බැලීමේ දී ජලය හේතු ගෙන ඇති වූ ගංවතුර තත්ත්වයන් අමතක කළ නොහැක. අපේ රටේ මෑත කාලීන අත්දැකීම වන්නේ, උග්‍ර නියඟයකට මුහුණ දී සිටි අප ඒ හා සමඟම දැඩි ගංවතුර තත්ත්වයකට ද මුහුණ දීමයි. පිරිසිදු පානීය ජලය නොමැතිකම තුළ ඇති වන ගැටලු සංකීර්ණය. ඒ අනුව සීමිත ජල ප්‍රමාණයක් කළමනාකරණය කර ගනිමින් පානීය ජල අවශ්‍යතාවය සහ අනෙකුත් සියලුම කටයුතුවලට යොදා ගැනීම අද අප හමුවේ ඇති අභියෝගයයි.

තිරසාර සංවර්ධනයේ 6 වන ඉලක්කය වනුයේ සැමට සුරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමයි. එබැවින් එම ඉලක්කය ජය ගනිමින් මෙරට සියලුම රට වැසියන්ට සුරක්ෂිත පානීය ජලය සැපයීම සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරමින් ජනතාව දැනුවත් කිරීම මඟින් පරිසරය ආරක්ෂා කර, බීමට සුදුසු පානීය ජලය සැපයීමේ කාර්යභාරයට අපි උර දෙන්නෙමු. ඒ සඳහා අපගේ කැපවීම මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව හරහා මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට දැක ගත හැකිය.

තවද, සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයා බැලීමේ දී අඩු අවධානයක් යොමු කිරීම බරපතල ගැටලුවකි. අමාත්‍යාංශය මඟින් සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරමින් තිබෙන අතර ඒවා නිසි ලෙස පවත්වාගෙන යාම එක් කණ්ඩායමකට පමණක් කළ හැකි කාර්යයක් නොවේ. සමස්තයක් ලෙස ගත් කළ පිරිසිදු පානීය ජලය සැපයීමත් සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමත් අපගේ වගකීමක් වන අතර පාසල් මට්ටමින්, ප්‍රජා සංවිධාන ඇතුළු බිම් මට්ටමේ සංවිධාන හා ජනමාධ්‍ය තුළින් මෙහි වටිනාකම පිළිබඳ දැනුවත්භාවය ඇති කරමින් සීමිත සම්පතක් වූ ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමට ජනතාව පෙළඹවීම සියලුදෙනාගේ වගකීමක් බව සිහිපත් කරනු කැමැත්තෙමි.

අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත්,ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවත් එක්ව මෙම භාරදූර කාර්යභාරය මැනවින් කළමනාකරණය කළ යුතුව ඇත.ඒ සඳහා රටක් ලෙසත්, අමාත්‍යාංශය ලෙසත් එම අභියෝගය ජය ගැනීමට මාගේ උපරිම දායකත්වය ලබා දෙමි.

**ලකී ජයවර්ධන (පා.ම)**

නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය

# අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



පෘථිවි ගෝලයෙන් හතරෙන් තුනකට වැඩි ප්‍රමාණයක් ජලයෙන් වැසී පැවතියත් එම ජල ප්‍රමාණයෙන් 97%ක් ම ලවන ජලය වේ. මිරිදිය ජලය ලෙස පවතිනුයේ 3% ක් තරම් වන සුළු ප්‍රමාණයකි. මෙයින් ද මිනිසාට ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ලෝකයේ ඇති මුළු ජල ප්‍රමාණයෙන් 0.6%කටත් වඩා අඩු වේ. කාලගුණික විපර්යාස සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙම සීමිත ජල සම්පත ද ඉතා සීඝ්‍රයෙන් ක්ෂය වෙමින් පවතී. මිහිමත ජීවත් වන සෑම පුරවැසියකුගේම වගකීම එය රැක ගැනීමයි.

වැඩි වන ජනගහනය සඳහා ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය ලබා දීම, සෑමට සනීපාරක්ෂාව තහවුරු කිරීම සහ පසුගාමී නගරවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සම්පත් වෙන් කිරීමේ ප්‍රධාන වගකීම් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව වර්ෂ 2030 වන විට අප රටෙහි සමස්ත ජනගහනය සඳහා ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව ලබා දීම තහවුරු කිරීම හා සුරක්ෂිත නළ ජල ආවරණය 60% දක්වා ඉහළ නැංවීමට සැලසුම් කර ඇත.

අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාපෘති සහ වැඩසටහන් දියත් කිරීමේ ප්‍රධාන ආයතන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මීට අමතරව දිස්ත්‍රික් 07ක් පුරා ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) මඟින් ද ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

මේ වන විට දිවයිනේ ජනගහනයෙන් 90.6% ට ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය ඇති අතර ආරක්ෂිත පානීය නල ජල ආවරණය 50.5% ක් වේ.මේ වන විට ලබා දී ඇති මුළු නල ජල සංඛ්‍යාව මිලියන 2.32ක් පමණ වන අතර මෙම වසර තුළ පමණක් නල ජල සම්බන්ධතා 109,462ක් ලබා දී ඇත. එමෙන්ම, 2015 වසර සිට 2018 වසර දක්වා කාලය තුළ මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති 18ක පමණ වැඩ අවසන් කර ඇති අතර මේ වසර තුළ නව ජල ව්‍යාපෘති 07ක් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියක් අරම්භ කර ඇත.

මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති වලට අමතරව හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීමේ අරමුණින් විශේෂ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වේ. ඒ අතර වැසි ජලය රැස් කිරීමේ වැඩසටහන, WASH වැඩසටහන වැනි වැඩසටහන් ද අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. තවද ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා සහ හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය සඳහා හේතු සාධක හඳුනා ගැනීම පිණිස ද වියළි ප්‍රදේශවල වැසි ජලය එක්රැස් කිරීමේ හා භාවිතා කිරීමේ ක්‍රම හා තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය මඟින් කටයුතු කරනු ලබයි.

මෙම ව්‍යාපෘති හා වැඩසටහන් නියමිත කාලයට අවසන් කිරීම සඳහා ඉලක්කගත කාර්යක්ෂම ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගැනිමට අපේක්ෂා කරමි.

**එම්.එම්.පී.කේ.මායාදුන්නෙ**
ලේකම්
නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

# රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



පානීය ජලය පිරිසිදු කර ජනතාවට ලබා දීමේ භාරදූර කාර්යය, සනීපාරක්ෂක කටයුතු සහ නොදියුණු කුඩා නගර සංවර්ධනය කිරීම, මෙම අමාත්‍යාංශයට පැවරී ඇති වගකීම වේ.

2018 වර්ෂය අවසන් වන විට පැවති බොහෝ අභියෝග හමුවේ ජනගහනයෙන් 50.5ක ප්‍රතිශතයකට සුරක්ෂිත පානීය නල ජලය ලබා දීම, 2.06ක ප්‍රතිශතයකින් නල මගින් මලාපවහන පහසුකම් ලබා දීම සහ නොදියුණු කුඩා නගර සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 3,500 ක පමණ ව්‍යාපෘති දියත් කිරීම සිදු කෙරිණි.

මෙම අභියෝග ජය ගැනීමේ භාරදූර කාර්යයේ දී නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත්, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සහ මෙම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති ඉටු කරන ලද කාර්යභාරය නිසා මෙම කටයුතු සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

තවද, අප ඉතිහාසයේ වැසි ජලය එකතු කිරීමේ ඉතා දියුණු ජන සංස්කෘතියකට උරුමකම් කියන රටකි. එම දේශීය ඥානය උපයෝගී කර ගනිමින් වැසි ජලය රැස්කර ප්‍රයෝජනයට ගැනීම සඳහා විශේෂ අවධානය යොමු කර ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය ප්‍රජාව සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා රුපියල් මිලියන 200ක ව්‍යාපෘති හා වැඩසටහනක් ද දියත් කර ඇත.

ජලය යනු අපේ ජීවයයි. එය රැකගැනීම සැමගේ යුතුකම හා වගකීමයි.

**ජේ. එම්. මංගලතිස්ස**
ලේකම්
නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

# පටුන

**පළමු පරිච්ඡේදය...................................................................................................................... 1**

1.1 හැඳින්වීම .................................................................................................................. 2

1.2 කාර්යයන්.................................................................................................................. 3

1.3 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ ව්‍යාපෘති .......................................................... 3

1.4 ශ්‍රී ලංකාවේ පානීය ජල සැපයුම හා සනීපාරක්ෂක පහසුකම් ආවරණය .......................................... 4

1.5 නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය - 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය .......................... 6

1.6 2015-2018 වර්ෂය තුළ ළඟා කරගත් කාර්ය සාධනය.................................................................. 7

1.7. 2015 – 2018 ලබාදුන් ජල සම්බන්ධතා සංඛ්‍යාව (පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන්) ............................... 8

**දෙවන පරිච්ඡේදය...................................................................................................................... 9**

2.1 2018 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදනවල 2018.12.31 දිනට සමස්ත ප්‍රගතිය ........................................... 10

2.2 අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ව්‍යාපෘති ............................................... 11

2.3 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා ඉටුකල කාර්යයන් ........... 20

2.4 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සහ වැඩසටහන් ........................................................................................................ 26

# පළමු පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

වාතය, ජලය, ආහාර හා ඇඳුම් පැළඳුම් මානව වර්ගයාගේ මූලික අවශ්‍යතාවයන්ය. වාතය මිනිසාගේ මූලිකම අවශ්‍යතාවය වුවත් පිරිසිදු වාතය ඉතා සීමිත පරිසරයන්හි දී හැර නිරායාසයෙන් ලබා ගැනීමේ හැකියාව තවමත් පවතී. අතීතයේ දී පිරිසිදු ජලය පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව පැවතියත් ජනගහනයේ වැඩිවීම, කර්මාන්ත වර්ධනය ස්වභාවික පරිසරය විනාශවීම සහ කාලගුණ වෙනස්වීම් ඇතුළු කරුණු රාශියක් මත පිරිසිදු පානීය ජලය සපයා ගැනීම දුෂ්කර වූ කාර්යයක් බවට අද පත්ව ඇත. ජලය ජීවයේ උපත මෙන් ම පැවැත්ම ද කාර්මික සංවර්ධනය ද තීරණය කරන ප්‍රධානම සාධකයකි. සෑම රජයක ම තම රටෙ හි ජනතාවගේ සුරක්ෂිත පානීය ජල අවශ්‍යතාව හා රටෙහි කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය ජලය සැපයීම, වගකීම් අතරින් ප්‍රධාන තැනක් ගනී.

සෑම රටකම ජනතාවට සුරක්ෂිත පානීය ජලය සැපයීමේ ඇති වැදගත්කම නිසාම මේ සම්බන්ධයෙන් අන්තර් ජාතික වශයෙන් ද අවධානය යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් සහස්‍ර සංවර්ධන අරමුණ පිහිටුවීමේ දී එහි අරමුණු අංක 07 යටතේ 1990 වර්ෂයේ දී 64% ක් වූ ආරක්ෂිත පානීය ජල සැපයුම 2018 වර්ෂය අවසන් වන විට 90.60% දක්වා වර්ධනය කර ගැනීමට ඉලක්ක ගත කර තිබූ අතර එය සාධනය කර ගැනීමට ද හැකි වී ඇත.

සහස්‍ර සංවර්ධන ඉලක්ක යාවත්කාලීන කර තිරසාර සංවර්ධන අරමුණු පිහිටුවීමේ දී ද ආරක්ෂිත පානීය ජලය සැපයීමේ වැදගත්කම නිසාම 2030 වසර වන විට සැමට ආරක්ෂිත පානීය ජලය සැපයීමට ඉලක්ක කර ඇත. මෙහිදී ඉන් ඔබ්බට ගොස් ජලය දූෂණය අවම කිරීම මඟින් 2030 වනවිට ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම ද අරමුණු කර ඇත. ආරක්ෂිත පානීය ජලය සනීපාරක්ෂාව පිළිබඳ අන්තර්ජාතික වශයෙන් ශ්‍රී ලංකාව ඇති කර ගත් බැඳීම් හා තම රටෙහි ජනතාවට පානීය ජලය සැපයීමේ වගකීම ද විශේෂයෙන් පානීය ජලය ආශ්‍රිතව රටෙ හි ප්‍රදේශ කිහිපයකම ජනතාව මුහුණ පා ඇති හඳුනා නොගත් වකුගඩු රෝගී තත්ත්වය ද මත ශ්‍රී ලංකා රජය ද ආරක්ෂිත පානීය ජලය සැපයීම සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමු කර ඇත.

ආරක්ෂිත පානීය ජලය සැපයීම සම්බන්ධයෙන් වූ රජයේ මෙම ප්‍රමුඛ සහ සුවිශේෂී අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා වෙනම අමාත්‍යාංශයක් සෑම රජයක් විසින් ම ස්ථාපිත කර ඇත. ඒ අනුව 2015 ජනාධිපතිවරණයෙන් අනතුරුව ද නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන නමින් අමාත්‍යාංශයක් අංක 1897/15 දරණ 2015.01.18 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම අමාත්‍යාංශය යටතට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය හා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව යන දෙපාර්තමේන්තු හා ආයතන ඇතුළත් විය.

2015 වර්ෂයේ අගෝස්තු මාසයේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව අමාත්‍යාංශ විෂය පථය සංශෝධනයට ලක් වූ අතර ඒ අනුව 1933/13 අංක දරණ 2015 සැප්තැම්බර් 21 දිනැති ගැසට් පත්‍රය මඟින් නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ස්ථාපිත කළ අතර ඒ යටතට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ඇතුළත් විය.

ඉන් පසු 2018 වර්ෂයේ දෙසැම්බර් මස සිදු වූ සංශෝධනය සමඟ අංක 2103/33 හා 2018 දෙසැම්බර් 28 දින දරණ විශේෂ ගැසට් පත්‍රය මඟින් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ස්ථාපිත විය. ඒ යටතට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ඇතුළත් විය. විෂය පථය සංශෝධනය වුවත් පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ වගකීම මෙම අමාත්‍යාංශය වෙත අඛණ්ඩව පැවරී ඇත.

## 1.2 කාර්යයන්

- නගර සැලසුම් සහ ජලසම්පාදන විෂයයන් හා සම්බන්ධ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම හා අදාළ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂය පථය යටතට ගැනෙන ඒ හා සම්බන්ධ විෂයයන් අධීක්ෂණය සහ ඇගයීම.

- විශේෂ නගර සැලසුම් හා සංවර්ධන කාර්යයන්

- නාගරික සංවර්ධන කටයුතුවල දී ජාතික භෞතික සැලසුම් පදනම් කොට ගෙන සියලු ඉදි කිරීම් කටුයුතු මෙහෙය වීම හා නියාමනය කිරීම.

- සියලු පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය සැපයීම තහවුරු කිරීම පිණිස ක්‍රියාමාර්ග ගැනීම.

- ජල සැපයුම් සේවා, මලාපවහන ක්‍රම සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව පරික්ෂා කිරීම, සැලසුම් කිරීම, සැලසුම් සැකසීම, ඉදිකිරීම මෙහෙය වීම සහ නඩත්තු කිරීම.

- ප්‍රජා ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම.

- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තුමේන්තුව වෙත පවරා ඇති අනෙකුත් සියලු විෂයයන් හා සම්බන්ධ කටයුතු කිරීම.

- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සුපරීක්ෂණය කිරීම.

## 1.3 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ ව්‍යාපෘති

2018 වර්ෂයේ දෙසැම්බර් මස සිදු වූ සංශෝධනය සමඟ අංක 2103/33 හා 2018 දෙසැම්බර් 28 දින දරණ විශේෂ ගැසට් පත්‍රය මඟින් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ස්ථාපිත වූ අතර ඒ යටතට පහත සඳහන් ආයතන හා ව්‍යාපෘති ඇතුළත් කර ඇත.

- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
- සනීපාරක්ෂාව පිළිබඳ කලාපීය මධ්‍යස්ථානය (SACOSAN)
- ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)
- චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය

## 1.4 ශ්‍රී ලංකාවේ පානීය ජල සැපයුම හා සනීපාරක්ෂක පහසුකම් ආවරණය

### 1.4.1 මූලාශ්‍ර අනුව ආරක්ෂිත පානීය ජල සැපයුම් ආවරණය - 2018




**ප්‍රස්ථාරය 01**

මූලාශ්‍රය-ජා. ජ. ස. හා ජ.ම.

### 1.4.2 මූලාශ්‍ර අනුව ශ්‍රී ලංකාවේ සනීපාරක්ෂක පහසුකම් - 2018




**ප්‍රස්ථාරය 02**

මූලාශ්‍රය-ජා. ජ. ස. හා ජ.ම.

*නල මලාපවහන ප්‍රතිශතය 2.07ක් වන අතර 2018 දී එය 2.06% කි. ජනගහන වර්ධනය සමඟ 2018 වර්ෂය තුළ නල මලාපවහන ප්‍රතිශතය අඩු වී ඇත.

### 1.4.3 සුරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා උපාය මාර්ග

රටේ සියලුම ජනතාව සඳහා සුරක්ෂිත පානීය ජලය හා සෞඛ්‍යාරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් සැපයීමට රජය විසින් පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

### 1.4.4 සුරක්ෂිත පානීය ජල සැපයුම පිළිබඳ උපාය මාර්ග

- ඉහළ යමින් පවතින ගෘහස්ථ හා ගෘහස්ථ නොවන ඉල්ලුම සලකා බැලීම මගින් නල ජල සැපයුම් ආවරණය ඉහළ නැංවීම.
- සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ දී ප්‍රාදේශීය වශයෙන් පවතින අසමානතා අඩු කිරීම.
- ප්‍රදේශය පදනම් කරගත් සාධක හා පිරිවැය සඵලතාව සැලකිල්ල ට ගනිමින් නව ජල යෝජනා ක්‍රම සැලසුම් කිරීම.
- හඳුනා නොගත් වකුගඩු රෝගය පැතිරී ඇති ප්‍රදේශ සඳහා ආරක්ෂිත පානීය ජලය සැපයීම.
- ජල මූලාශ්‍රයන්, තුළුමං, ප්‍රජා මූලික සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන යෝජනා ක්‍රමවල ජලයේ තත්ත්වය සහ ප්‍රමාණය වැඩිදියුණු කිරීම.
- ජල උපකරණ වෙනත් උපාංග සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම මගින් නල ජල සැපයුම් ක්‍රම ප්‍රවර්ධනය කිරීම.
- හඳුනා නොගත් වකුගඩු රෝගයට මූලික හේතුව හඳුනා ගැනීම පිණිස සහ එම රෝගය වැළැක්වීම සඳහා භූගත ජලය පවිත්‍ර කිරීම සඳහා වඩාත් ම ශක්‍යතාව සහිත පවිත්‍ර කිරීමේ ක්‍රමයක් හඳුනා ගැනීම පිණිස උසස් හා නවීන පර්යේෂණ/ අධ්‍යයනයන් සිදුකිරීම.
- කාර්මික අංශය සඳහා වර්ධනය වෙමින් පවතින නල ජල ඉල්ලුම සපුරාලීම.
- නල ජල සේවා සැපයීමේ යෙදී සිටින ආයතනයන්ගේ ධාරිතාවන් වැඩිදියුණු කිරීම.
- ජනතා හිතකාමී ලාභ ලබන ආයතනයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා මඟපෙන්වීම.

### 1.4.5 සුරක්ෂිත පානීය ජල සැපයුම් පිළිබඳ ඉලක්ක

- 2020 වන විට ශ්‍රී ලාංකික සැමට සුරක්ෂිත පානීය ජලය සැපයීම
- 2020 වන විට නල ජල සැපයුම් ආවරණය 55% දක්වා වර්ධනය කිරීම.
- හඳුනා නොගත් හේතූන් මත වන වකුගඩු රෝගය පැතිර ඇති ප්‍රදේශ සඳහා නල ජල පහසුකම් සැපයීම.
- ජලයේ ගුණාත්මක බව 100% කින් තහවුරු කිරීම.
- කර්මාන්ත සඳහා ජල අවශ්‍යතාව 100% කින් සම්පූර්ණ කිරීම.
- පානීය ජල පහසුකම් සපයනු ලබන ආයතනික ව්‍යුහය කාර්යක්ෂම කිරීම.

### 1.4.6 සනීපාරක්ෂාව පිළිබඳ උපායමාර්ග

- විශේෂයෙන් ග්‍රාමීය හා වතු අංශය ද ඇතුළත්ව සනීපාරක්ෂක පහසුකම් භාවිතය ඉහළ නැංවීම.
- සනීපාරක්ෂාව හා ස්වස්ථතාව පිළිබඳ අධ්‍යාපනික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රධාන නගරවල මලාපවහන පහසුකම් ඉහළ නැංවීම.
- දිවයිනේ අපජල බැහැර කිරීමේ සේවා වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සහාය සැලසීමට හැකිවන පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම.

### 1.4.7 සනීපාරක්ෂාව පිළිබඳ ඉලක්ක

- දිවයින පුරා 100% ක සෞඛ්‍යාරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් තහවුරු කිරීම.
- 2020 වන විට නාගරික ජනගහනයෙන් 2.25% ක් සඳහා නල මලාපවහන පහසුකම් සැපයීම.

## 1.5 නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය - 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 1 | ලේකම් | | 1 | 1 | නැත |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ) | 1 | 1 | නැත |
| 3 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ) | 1 | 1 | නැත |
| 4 | අතිරේක ලේකම් (තාක්ෂණ) | ශ්‍රී.ලං.ඉ.සේ. (විශේෂ) | 1 | 1 | නැත |
| 5 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. (විශේෂ) | 1 | 1 | නැත |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | ශ්‍රී.ලං.ප.සේ. I | 1 | 0 | 1 |
| 7 | අධ්‍යක්ෂ (ඉඩම්) | ශ්‍රී.ලං.ප.සේ. I | 1 | 1 | නැත |
| 8 | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. I | 1 | 1 | නැත |
| 9 | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | ශ්‍රී.ලං.ඉ.සේ. I | 1 | 1 | නැත |
| 10 | අධ්‍යක්ෂ (විශේෂ විමර්ශන) | ශ්‍රී.ලං.ප.සේ. I | 1 | 0 | 1 |
| 11 | අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. I | 1 | 1 | නැත |
| 12 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. I | 1 | 1 | නැත |
| 13 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. I | 1 | 1 | නැත |
| 14 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. III/II | 2 | 1 | 1 |
| 15 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. III/II | 1 | 0 | 1 |
| 16 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | ශ්‍රී.ලං.ප.සේ. III/II | 1 | 0 | 1 |
| 17 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. III/II | 1 | 1 | නැත |
| 18 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ.III/II | 2 | 2 | නැත |
| 19 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (විශේෂ විමර්ශන) | ශ්‍රී.ලං.ප.සේ. III/II | 1 | 1 | නැත |
| 20 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | ශ්‍රී.ලං.ඉ.සේ. III/II | 1 | 1 | නැත |
| 21 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. III/II (අධි සේවක) | 2 | 2 | නැත |
| 22 | නීති නිලධාරී | ශ්‍රී.ලං.ප.සේ. III/II | 1 | 0 | 1 |
| 23 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. III | 1 | 1 | නැත |
| 24 | පරිපාලන නිලධාරී | රා.ක.ස.අධි පන්තිය | 2 | 1 | 1 |
| 25 | භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | ශ්‍රී.ලං.භාෂා පරිවර්තක සේවය | 3 | 1 | 2 |
| 26 | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 1 | 1 | නැත |
| 27 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. I/II/III | 32 | 28 | 4 |
| 28 | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය | 45 | 28 | 17 |
| 29 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා තා.සේවය | 2 | 1 | 1 |
| 30 | රියදුරු | රියදුරු සේවය I/II/III | 16 | 10 | 6 |
| 31 | කා.සේ.සේ. I/II/III | කා.සේ.සේ.සේවය | 21 | 17 | 4 |
| 32 | කාර්මික සහකාර | දෙපාර්තමේන්තුගත | 1 | 0 | 1 |
| 33 | කැමරා ක්‍රියාකරු (වීඩියෝ) | තාවකාලික | 1 | 0 | 1 |
| 34 | ඡායාරූප ශිල්පී | තාවකාලික | 1 | 0 | 1 |
| 35 | කැමරා ක්‍රියාකරු (සහායක) | තාවකාලික | 1 | 1 | නැත |
| 36 | උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරී | උපාධිධාරී අභ්‍යාසලාභී | 0 | 7 | 0 |
| රාජ්‍ය අමාත්‍ය කාර්යාලය | | | | | |
| 37 | රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් | | 1 | 0 | 1 |
| 38 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. I/II/III | 1 | 0 | 1 |
| 39 | රියදුරු I/II/III | | 1 | 1 | නැත |
| 40 | කා.සේ.සේ. I/II/III | කා.සේ.සේ.සේවය | 1 | 0 | 1 |
| | එකතුව | | **156** | **116** | **47** |

*අයවැය, ගිණුම්, සැලසුම්, මානව සම්පත්, සංවර්ධන, ප්‍රසම්පාදන, තොරතුරු තාක්ෂණ, විගණන සහකාර යන තනතුරු නාම යටතේ බඳවා ගන්නා ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

**1.6 2015-2018 වර්ෂය තුළ ළඟා කරගත් කාර්ය සාධනය**

| | දර්ශක | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| **සෞඛ්‍යාරක්ෂිත සනීපාරක්ෂක ක්ෂේත්‍රය සඳහා** | | | | | |
| 1. | සනීපාරක්ෂක පහසුකම් ප්‍රතිශතය | 86% | 87.43% | 87.48% | 87.40% |
| 2. | නල මලාපවහන පහසුකම් ආවරණ ප්‍රතිශතය | 2% | 2.08% | 1.99% | 2.06% |
| **පානීය ජල පහසුකම් ක්ෂේත්‍රය සඳහා** | | | | | |
| 3. | ආරක්ෂිත පානීය ජල ආවරණය | 86% | 87.8% | 89.3% | 90.60% |
| 4. | නල ජල ආවරණ ප්‍රතිශතය | 45.9% | 47.7% | 49.2% | 50.50% |
| 5. | නල ජල ආවරණ ප්‍රතිශතය<br>(ජා.ජ.ස. හා ජ.ම. සතු) | 35.2% | 37.1% | 38.7% | 40.00% |
| 6. | මුළු දිවයින සඳහා ආදායම් නොලබන ජල ප්‍රතිශතය | 27.83% | 26.26% | 25.98% | 24.90% |
| 7. | කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය | 46.16% | 45.72% | 43.14% | 41.65% |
| 8. | මුළු නල ජල සම්බන්ධතා සංඛ්‍යාව<br>(ජා.ජ.ස. හා ජ.ම. මඟින් සපයන ලද) | මිලියන 1.95 | මිලියන 2.09 | මිලියන 2.23 | මිලියන 2.33 |
| 9. | වර්ෂය තුළ ලබාදුන් නව ජල සම්බන්ධතා සංඛ්‍යාව<br>(ජා.ජ.ස. හා ජ. ම. මඟින් සපයන ලද) | 121,723 | 138,750 | 126,701 | 109,462 |
| **ආයතනික කාර්ය සංඛ්‍යා දර්ශක** | | | | | |
| 10. | නල ජල සම්බන්ධතා 1,000 කට සිටින කාර්ය මණ්ඩල සංඛ්‍යාව | 5.5 | 4.95 | 4.72 | 4.31 |

මූලාශ්‍රය - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හා අමාත්‍යාංශ වාර්තා

## 1.7. 2015 – 2018 ලබාදුන් ජල සම්බන්ධතා සංඛ්‍යාව (පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන්)

| පළාත / ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන | කලාපය | 2015 දෙසැම්බර් වන විට ලබා දී තිබූ මුළු ජල නල සම්බන්ධතා ගණන | 2016 දෙසැම්බර් වන විට ලබා දී ඇති මුළු ජල නල සම්බන්ධතා ගණන | 2017 දෙසැම්බර් වන විට මුළු ජල නල සම්බන්ධතා ගණන | 2018 දෙසැම්බර් වන විට ලබා දී තිබූ මුළු ජල නල සම්බන්ධතා ගණන |
|---|---|---|---|---|---|
| බටහිර- මධ්‍යම | ප්‍රමුඛතාව | 2,290 | 2,293 | - | - |
| | කොළඹ නගරය | 138,100 | 140,841 | 144,890 | 146,592 |
| | කෝට්ටේ (TEC උතුර) | 154,809 | 160,781 | 166,770 | 171,910 |
| | මහරගම (TEC South) | 126,120 | 140,083 | 150,630 | 159,956 |
| බටහිර - උතුර | කැලණිය (TNC) | 169,717 | 183,519 | 194,207 | 203,622 |
| | ගම්පහ | 67,544 | 72,984 | 77,528 | 80,184 |
| බටහිර- දකුණ | දෙහිවල (TSC) | 102,479 | 105,136 | 107,363 | 109,330 |
| | කළුතර | 60,345 | 63,912 | 67,570 | 70,113 |
| | පානදුර | 56,975 | 67,687 | 77,970 | 85,089 |
| මධ්‍යම | මහනුවර | 236,052 | 248,735 | 261,356 | 272,690 |
| වයඹ | කුරුණෑගල | 69,182 | 73,782 | 78,036 | 82,950 |
| උතුරු මැද | අනුරාධපුරය | 100,668 | 107,686 | 114,351 | 121,609 |
| සබරගමුව | කෑගල්ල | 51,565 | 53,468 | 55,387 | 57,200 |
| | රත්නපුර | 43,219 | 47,489 | 51,219 | 55,102 |
| දකුණ | හම්බන්තොට | 97,728 | 102,406 | 106,237 | 109,804 |
| | මාතර | 91,709 | 94,646 | 97,267 | 99,443 |
| | ගාල්ල | 103,780 | 106,371 | 108,520 | 111,276 |
| ඌව | බණ්ඩාරවෙල | 46,213 | 48,706 | 53,409 | 59,265 |
| | මොණරාගල | 35,094 | 37,567 | 41,385 | 43,987 |
| උතුර | යාපනය | 14,834 | 17,817 | 21,653 | 24,015 |
| නැගෙනහිර | අම්පාර | 38,891 | 50,967 | 58,005 | 62,609 |
| | මඩකලපුව | 34,759 | 40,748 | 46,948 | 50,780 |
| | ත්‍රිකුණාමලය | 47,756 | 55,902 | 63,866 | 72,829 |
| | අක්කරපත්තුව | 63,892 | 68,935 | 74,605 | 78,279 |
| එකතුව | | **1,953,721** | **2,092,471** | **2,219,172** | **2,328,634** |

# දෙවන පරිච්ඡේදය

## 2.1 2018 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදනවල 2018.12.31 දිනට සමස්ත ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය 2018.12.31 දිනට | | අතැති බිල්පත් | මූල්‍ය ප්‍රගතිය 2018.12.31 දිනට (අතැති බිල්පත් සමඟ) | |
|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි | % | රු.මි | රු.මි | % |
| නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | | | | | | | |
| 1 | හඳුනා නොගත් වකුගඩු රෝගවලට ගොදුරු වූ ප්‍රදේශ සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම | 585 | 492.56 | 84.20 | 60.67 | 553.23 | 94.57 |
| 2 | ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 130 | 82.46 | 63.43 | 34.99 | 117.45 | 90.35 |
| 3 | සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු සමුළුවේ පසු විපරම් කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක සනීපාරක්ෂක වැඩසටහන | 20 | 19.67 | 98.39 | | 19.67 | 98.39 |
| 4 | දකුණු ආසියානු සනීපාරක්ෂාව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම | 13 | 7.27 | 55.92 | | 7.27 | 55.92 |
| 5 | වැසි ජලය එක්රැස් කිරීමේ වැඩසටහන | 5 | 0.67 | 13.40 | 2.11 | 2.78 | 5.56 |
| 6 | ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ ජල මූලාශ්‍ර දූෂණය වීම වැළැක්වීම | 5 | 4.10 | 82.00 | 0.90 | 5.00 | 100 |
| 7 | කෑගල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම් ගම්මාන සඳහා ජල පහසුකම් සැපයීම. | 112 | 90.35 | 80.67 | 20.13 | 110.48 | 98.64 |
| 8 | නගර සැලසුම් හා සංවර්ධන වැඩසටහන | 3,500 | 1,773.86 | 50.68 | 444.25 | 2,218.11 | 63.37 |
| **A** | **උප එකතුව (1+2+3+4+5+6+7+8)** | **4,370** | **2,470.94** | **56.54** | **563.05** | **3,033.99** | **69.43** |
| 09 | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ( ලෝක බැංකුව) WASSIP | 4,767 | 4,691.4 | 98.41 | 75.6 | 4,767 | 100 |
| 10 | චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රධාන ව්‍යාපෘතිය | 325 | 247.42 | 76.13 | 0.59 | 248.01 | 76.31 |
| **B** | **අමාත්‍යාංශ එකතුව (A+09+10)** | **9,462** | **7,409.76** | **78.31** | **639.24** | **8,049.00** | **85.07** |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | | | | | | | |
| 11 | අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 20 | 4.56 | 22.80 | 1.77 | 6.33 | 31.65 |
| 12 | මාතර කෙටිකාලීන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 75 | 57.54 | 76.72 | 7.11 | 64.65 | 86.2 |
| 13 | වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - V (ආසියානු සංවර්ධන බැංකුව) (ADB v) | 50 | 49.9 | 99.80 | | 49.9 | 99.80 |
| 14 | කොළඹ ප්‍රදේශයේ ගෘහස්ථ අපජල සම්බන්ධතා සංඛ්‍යාව වැඩි කිරීම සහ ආරක්ෂිත සනීපාරක්ෂාව සඳහා ජනතාවට ඇති අවස්ථා ලබාදීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 315.15 | 315.10 | 99.98 | | 315.10 | 99.98 |
| 15 | බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය | 70 | 31.39 | 44.84 | 38.61 | 70 | 100 |
| 16 | තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය | 20 | 8.3 | 41.50 | 1.45 | 9.75 | 48.75 |
| 17 | මහා පරිමාණ ජල සම්පාදන හා අපජල ව්‍යාපෘති (Disbursement of Ongoing Projects) | 24,182.7 | 23,982.40 | 99.17 | | 23,982.4 | 99.17 |
| 18 | ත්‍රිකුණාමල ජල සම්පාදන ව්‍යාපෘතිය නවීකරණය | 155 | 132.05 | 85.19 | 22.95 | 155 | 100 |
| 19 | ඉඩම් පවරා ගැනීම් | 200 | 162.65 | 81.33 | | 162.65 | 81.33 |
| 20 | කඩිනම් ප්‍රාදේශීය සහා මාර්ග සංවර්ධන වැඩසටහන හේතු කොටගෙන උපයෝගීතා සේවා වෙනස් කිරීම/ ප්‍රතිස්ථාන ගත කිරීම | 250 | 168.92 | 67.57 | 81.08 | 250 | 100 |
| **C** | **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකතුව** | **25,337.85** | **24,912.81** | **98.32** | **152.97** | **25,065.78** | **98.93** |
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | | | | | | | |
| 21 | ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම | 200 | 56.77 | 28.39 | 100.44 | 157.21 | 78.60 |
| | **මුළු එකතුව (B+C+21)** | **34,999.85** | **32,379.34** | **92.51** | **892.65** | **33,271.99** | **95.06** |

## 2.2 අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ව්‍යාපෘති

### 2.2.1 කාලික වකුගඩු අකරණ රෝග නිවාරණ වැඩසටහන

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ සංවර්ධන පරමාර්ථය | ආරක්ෂිත පානීය ජල සම්පාදනය තුළින් වකුගඩු රෝග පාලනය | | | |
| 2018 වර්ෂය සඳහා වෙන් කිරීම් | මූලික - රු. මි. 800 | | සංශෝධිත - රු. මි. 585 | |
| ව්‍යාපෘති කාල සීමාව | 2018.01.01 – 2018.12.31 | | | |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පවුල් 22,492, පාසැල් සිසුන් 19,121 | | | |
| සේවා ආවරණය ලබන ප්‍රදේශ | උතුර, උතුරු මැද, වයඹ, නැගෙනහිර, මධ්‍යම, සබරගමුව, ඌව, දකුණ | | | |
| 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | ඉලක්කය | ළඟා කරගත් | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය | ඉලක්කය | ළඟා කරගත් |
| | 585 | 492.56 | | 100% | 80% |

### 2.2.2 ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ සංවර්ධන පරමාර්ථය | ග්‍රාමීය ජනතාවට පිරිසිදු පානීය ජල සම්පාදනය හා එම ජනතාවගේ සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම | | | | |
| 2018 වර්ෂය සඳහා වෙන් කිරීම් | මූලික - රු. මි. 200 | | සංශෝධිත -රු. මි. 130 | | |
| ව්‍යාපෘති කාල සීමාව | 2018.01.01 – 2018.12.31 | | | | |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 48,500 | | | | |
| සේවා ආවරණය ලබන ප්‍රදේශ | උතුර, උතුරු මැද, වයඹ, නැගෙනහිර, මධ්‍යම, සබරගමුව, ඌව | | | | |
| 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | ඉලක්කය | ළඟා කරගත් | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය | ඉලක්කය | ළඟා කරගත් |
| | 130 | 82.46 | | 100% | 60% |

### 2.2.3 වැසි ජල ටැංකි ස්ථාපිත කිරීමේ වැඩසටහන

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ සංවර්ධන පරමාර්ථය | වැසි ජලය එක්රැස් කොට පිරිසිදු පානීය ජලය ලබා දීම | | | | |
| 2018 වර්ෂය සඳහා වෙන් කිරීම් | මූලික - රු. මි. 5 | | සංශෝධිත - රු. මි. 5 | | |
| ව්‍යාපෘති කාල සීමාව | 2018.01.01 – 2018.12.31 | | | | |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පවුල් 26, පාසැල් 3, රෝහල් 3 | | | | |
| සේවා ආවරණය ලබන ප්‍රදේශ | උතුරු මැද, , ඌව, බස්නාහිර | | | | |
| 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | ඉලක්කය | ළඟා කරගත් | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය | ඉලක්කය | ළඟා කරගත් |
| | 5 | 0.67 | | 100% | 90% |

## 2.2.4. ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමේ වැඩසටහන

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ සංවර්ධන පරමාර්ථය | ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම | | | | |
| 2018 වර්ෂය සඳහා වෙන් කිරීම් | මූලික - රු. මි. 5 | | සංශෝධිත - රු. මි. 5 | | |
| ව්‍යාපෘති කාල සීමාව | 2018.01.01 – 2018.12.31 | | | | |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 75,000 | | | | |
| සේවා ආවරණය ලබන ප්‍රදේශ | මධ්‍යම, සබරගමුව | | | | |
| 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | ඉලක්කය | ළඟා කරගත් | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය | ඉලක්කය | ළඟා කරගත් |
| | 5 | 4.1 | | 100% | 98% |

## 2.2.5 SACOSAN වැඩසටහන

| | | | | | |
|---|---|---|---|---|---|
